## කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

## ඒකාබද්ධ ග්‍රාම - නගර සංවර්ධන හා දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය (IRDCRP) සංරචකය 1

# අභිලාෂය ප්‍රකාශ කිරීම සඳහා ඉල්ලීමයි (EOI -2026/1)

# තිරසර, ශක්තිමත් ග්‍රාමීය ආර්ථිකයක් ගොඩනැගීමට එක්ව කටයුතු කරමු

### ලෝක බැංකු සමූහයේ මූලාරම්භය සහිත "Agriconnect" සමග සහයෝගීතාව

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ (MOALLI) ලෝක බැංකු සමූහයේ සහයෝගිතාවයෙන්, ඒකාබද්ධ සංවර්ධන හා දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය (IRDCRP) විසින් අගයදම ආයෝජන, වාණිජ්‍ය හා අපනයන අරමුණු කරගත් කෘෂි ව්‍යාපාර හා අගය එකතු කළ, නවෝත්පාදන ව්‍යාපාරික අදහස් දරන ගොවි නිෂ්පාදන සංවිධාන, පොදු ලැයිස්තුගත නොමැති සමාගම්, නිෂ්පාදන සමුපකාර සමිති, සංවිධාන, ඒ හා සමාන නිෂ්පාදන සංවිධාන/ ආයතන වලින්, ඵලදායි හවුල්කාරිත්ව ව්‍යාපාර සංවර්ධන අවස්ථා සඳහා සලකා බැලීම පිණිස අභිලාෂය ප්‍රකාශ කිරීම සඳහා ආරාධනා කෙරේ.

ආර්ථික ප්‍රතිපත්ති හා ග්‍රාමීය සෞභාග්‍යය සඳහා වන රජයේ උපාය මාර්ගවල වැදගත් කොටසක් ලෙස නවීන හා වාණිජ්‍යමය වශයෙන් විවිධාංගීකරණය වූ කෘෂි – ආහාර පද්ධති සංවර්ධනය සැලකේ. ඒ අනුව IRDCRP ව්‍යාපෘතිය විසින්, තිරසර කෘෂි ආහාර පද්ධති, දේශගුණ සුහුරු කෘෂිකර්මය, කාර්යක්ෂම ජල කළමනාකරණය හා වැඩි දියුණු කළ ග්‍රාමීය ප්‍රජාවගේ ජීවනෝපාය ප්‍රවර්ධනය කරනු ලබයි.

### අගයදාම සංවර්ධනය උදෙසා ඵලදායි හවුල්කාරීත්වය

IRDCRP ව්‍යාපෘති සංරචකය 1 මගින්, ඵලදායි හවුල්කාරිත්වයක් තුළින්, කෘෂිකර්ම, පශු සම්පත්, ධීවර හා ජලජීවී, කුළු බඩු හා වැවිලි ඵලදාව සම්බන්ධව අගයදම සංවර්ධනය වෙත අවධානය යොමු කරයි. එසේම, තරුණ ව්‍යවසායිකත්වය ද ඇතුළත්ව, කෘෂි – සේවා සඳහා පෞද්ගලික අංශය සවිමත් කිරීම මගින් ආදායම් වැඩිකිරීම හා දේශගුණික විපර්යාසයන්ට මෙන්ම විවිධ ආර්ථික තත්ත්වයන්ට ඔරොත්තු දීම වර්ධනය කිරීම් සඳහා අරමුණු කරයි.

ප්‍රතිඵල දයක අගයදම ආයෝජන හඳුනා ගෙන පිරිවැය බෙදාගැනීමේ ක්‍රියාපටිපාටියක් තුළින් ආයෝජනය කරනු ලබන අතර, එයින් කොටසක් IRDCRP ව්‍යාපෘතිය විසින් ආයෝජන උත්ප්‍රේරක ලෙස ලබා දෙනු ලබන අතර, ඉතිරි පිරිවැය ප්‍රතිලාභියාගේ සහ හා වාණිජ බැංකුවක් වෙතින් ණය අරමුදල් ලබාගැනීමක් ලෙස සිදුකරනු ඇත.

### ඵලදායි හවුල්කාරිත්වයන් සිදුකරන ආකාරය

ව්‍යාපෘතිය විසින්, එක් එක් නිෂ්පාදන සංවිධානවල පරිණත භාවය පිළිබඳ තක්සේරුව මත පදනම්ව ඵලදායි හවුල්කාරිත්ව ලබා දෙන ආකාර දෙකකින් සහාය වන අතර, එක් එක් ආකාරයන් තුළින් වෙනස් වූ තාක්ෂණ හා මූල්‍ය සහාය ලබාදෙනු ඇත.

**ආකාර 1 (window 1) -** දියුණු වෙමින් පවතින ව්‍යාපාර සඳහා වන ඵලදායි හවුල්කාරීත්වය : සාපේක්ෂ වශයෙන් පරිපාලන හා කළමනාකරණ පද්ධති දියුණු නොවූ, සීමිත සාමාජිකත්වයක් සහිත සහ/ හෝ යෝජිත ආයෝජන ක්‍රියාකාරකම්වල පහළ මට්ටමේ සහභාගිත්වය ප්‍රදර්ශනය කරනු ලබන නිෂ්පාදන සංවිධාන සඳහා අරමුණු කරයි.

**ආකාර 2 (window 2)** පරිණත තත්ත්වයේ පසුවන ව්‍යාපාර සඳහා වන හවුල්කාරිත්වය : පරිණත බවට තක්සේරු කළ, ඉහළ පරිපාලනයක්, ශක්තිමත් කළමනාකරණ පද්ධතියක් සතු හා වෙනත් අදාළ පරිණත ගුණාංග ද ඇතුළත් යෝජිත ආයෝජන කටයුතු පිළිබඳ පැහැදිලි අවබෝධයක් සතු නිෂ්පාදන සංවිධාන සඳහා අරමුණු කරයි.

### අදාළ ආකාර (Windows) වල මූල්‍යමය පරාමිතීන්

| විස්තරය | | ආකාර 1 (window 1) | ආකාර 2 (window 2) |
|---|---|---|---|
| ආයෝජන ප්‍රදාන | | 35% හෝ ඇමරිකන් ඩොලර් 300,000 දක්වා (දළ වශයෙන් රුපියල් මිලියන 93) | 25% හෝ ඇමරිකන් ඩොලර් 500,000 දක්වා (දළ වශයෙන් රුපියල් මිලියන 155) |
| තමන්ගේ දායකත්වය | | 15% | 25% |
| මූල්‍ය ආයතන ණය | | 50% | 50% |
| එක් ප්‍රතිලාභිත්වයක් සඳහා ව්‍යාපාර යෝජනාවක් (BP) සඳහා උපරිම ආයෝජන ප්‍රදාන | | ඇමරිකන් ඩොලර් 2,000 (දළ වශයෙන් රුපියල් 620,000) | ඇමරිකන් ඩොලර් 2,500 (දළ වශයෙන් රුපියල් 770,000) |
| එක් එක් ව්‍යාපාර සැලැස්මක් හෝ ඵලදායි හවුල්කාරිත්වයක් සඳහා අවම ප්‍රතිලාභීන් ප්‍රමාණය | කෘෂිකර්ම | 100 | 100 |
| | පශු සම්පත් | 50 | 50 |
| | වැවිලි | 20 | 20 |
| | ධීවර | 20 | 20 |

### සුදුසුකම්ලත් අංශ

කෘෂිකර්ම, පශු සම්පත්, වාරිමාර්ග, ධීවර හා ජලජීවී, කුළුබඩු, වැවිලි භෝග,

### අයදුම්කරන පිළිවෙළ

උනන්දුවක් දක්වන නිෂ්පාදන සංවිධාන කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ www.agrimin.gov.lk හි Documents → forms (https://agrimin.gov.lk/downloads/forms) හා එම වෙබ් අඩෙවියේ “Read Our Latest Insights” හි ඇතුළත් කර ඇති ආකෘතියට අනුව අභිලාෂය ප්‍රකාශ කිරීමේ අයදුම්පත් (EOI) සම්පූර්ණ කර ලියාපදිංචි තැපැලෙන් ඉදිරිපත් කළ යුතුය.

අදාළ EOI බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ “EOI 2026/1” ලෙස පැහැදිලිව සටහන් කරන්න. EOI භාරගනු ලබන අවසන් දිනය, දැනට, 2026 අප්‍රේල් 10 දින වේ. (වැඩි විස්තර සඳහා ඉහත වෙබ් සබැඳියේ මාර්ග නිර්දේශ වෙත යොමුවන්න)

### තෝරාගැනීමේ ක්‍රමවේදය

අයදුම්කරුවන්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) විසින් සකසන ලද නිර්ණායකයන් මත තෝරා ගැනීම් සිදුකරන අතර, අදාළ තෝරා ගැනීම පළමුව පැමිණි අයහට පළමු ප්‍රමුඛතාව යන පදනමින් සිදු කෙරේ.

තෝරාගත් අයදුම්කරුවන්, ව්‍යාපෘති සහායක අනුමැතිය ලැබීමට පෙර සම්මුඛ පරීක්ෂණ, ක්ෂේත්‍ර පරීක්ෂණය හා සවිස්තරාත්ම ව්‍යාපෘති යෝජනා සංවර්ධන සැකසීමේ ක්‍රියාපටිපාටිය සඳහා යොමු කරනු ඇත.

වැඩි විස්තර සඳහා කරුණාකර, දුරකථන අංක 0112877550 මගින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය අමතන්න.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ඒකාබද්ධ ග්‍රාම - නගර සංවර්ධන හා දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය,**
**ව්‍යාපෘති කළමනාකරණ ඒකකය,**
**123/2, පන්නිපිටිය පාර,**
**බත්තරමුල්ල.**